FP/6/100/05/01/(iii) 29.12.2010

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක : 01/2010

පළාත් සභා ප්‍රධාන ලේකම්වරු
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්
රේගු අධ්‍යක්ෂ ජනරාල්
මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්

**2011 - අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම**
**මධ්‍යම රජයේ ආදායම් පළාත් සභාවලට මාරු කිරීම**

පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද අයවැය යෝජනාවට අනුව, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා (දේ.ආ.කො.ජ.), රේගු අධ්‍යක්ෂ ජනරාල් (රේ.අ.ජ.) හා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා විසින් රැස්කරනු ලබන පහත සඳහන් ආදායම් 2011.01.01 දින සිට බල පැවැත්වෙන පරිදි පහත දැක්වෙන පදනමට පළාත් සභාවලට මාරු කළ යුතු ය.

| | |
|---|---|
| (i) ජාතිය ගොඩනැගීමේ බද්ද | 33 1/3 % |
| (ii) මුද්දර බද්ද | 100% |
| (iii) වාහන ලියාපදිංචි කිරීමේ ගාස්තු | 70% |

2. ඒ අනුව, ජාතිය ගොඩනැගීමේ බදු ආදායම හා මුද්දර බදු ආදායම පළාත් සභාවලට මාරු කිරීම සඳහා පහත දැක්වෙන රැස්කිරීමේ හා මාරු කිරීමේ ක්‍රියාවලිය යොදා ගැනීමට තීරණය කර ඇත.

(අ) පළාත් සභාවලට මාරු කරනු ලබන ආදායම් රැස්කිරීම සඳහා බැංකු ගිණුම් පවත්වාගෙන යාම

දේ.ආ.කො.ජ./රේ.අ.ජ. විසින් දෛනික පදනම මත ප්‍රධාන ආදායම් රැස්කිරීමේ ගිණුම්වලින් එක් එක් ආදායම් කොටස් රැස් කිරීම සඳහා ලංකා බැංකුවේ හා මහජන බැංකුවේ බැංකු ගිණුම් දෙකක් ආරම්භ කොට පවත්වාගෙන යනු ඇත. මෙම ගිණුම් දෙක 2011.01.01 දින සිට ක්‍රියාත්මක වනු ඇත.

(ආ) <u>පළාත් සභා ගිණුම්වල බැරට ආදායම් මාරු කිරීම</u>

ආදායමෙන් පළාත් සභාවලට අයත් කොටස රැස් කිරීම සඳහා වන විශේෂ බැංකු ගිණුම්වල බැරට ඇති මුළු එකතුව සෑම සති දෙකක් අවසානය දී ම බැංකු මගින් පහත දැක්වෙන අනුපාතයන්ට අනුව, ආදායම් රැස්කිරීමේ ගිණුම් වෙනුවෙන් දේ.ආ.කො.ජ./රේ.අ.ජ. විසින් නිකුත් කරන ලද ස්ථාවර නියෝගයන්ට අනුව පළාත් සභා විසින් පවත්වාගෙන යනු ලබන පළාත් විශේෂ බැංකු ගිණුම්වලට බෙදා මාරු කළ යුතුය. මෙම අනුපාතයන් මුදල් කොමිසමේ එකඟත්වය සහිතව කාලීනව සංශෝධනය කිරීම සහ නැවත නියම කිරීම කෙරනු ඇත.

| පළාත | අනුපාතය |
|---|---|
| බස්නාහිර පළාත | 48% |
| මධ්‍යම පළාත | 9% |
| දකුණු පළාත | 9% |
| වයඹ පළාත | 9% |
| සබරගමුව පළාත | 5% |
| උතුරු මැද පළාත | 5% |
| ඌව පළාත | 5% |
| නැගෙනහිර පළාත | 5% |
| උතුරු පළාත | 5% |

දේ.ආ.කො.ජ./රේ.අ.ජ. විසින් මාසය අවසානයේ දී ගිණුමේ බැරට ශේෂයන් නොමැති බවට සහතික කර ගත යුතුය.

(ඇ) <u>පළාත් බැංකු ගිණුම් පවත්වාගෙන යාම</u>

ඉහත (2) (ආ) ඡේදයේ අරමුණු ප්‍රකාරව, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් විසින් තමන්ගේ ආදායම් කොටස දෙසතියකට වරක් ලබා ගැනීම සඳහා විශේෂිත බැංකු ගිණුම් දෙකක් ආරම්භ කොට පවත්වාගෙන යා යුතුය. ලංකා බැංකුවේ තැප්‍රොබේන් ශාඛාව සහ මහජන බැංකුවේ යූනියන් පෙදෙස ශාඛාව මගින් පහත බැංකු ගිණුම් අංක එක් එක් පළාත් සභාව වෙනුවෙන් ලබා දී ඇත. ප්‍රධාන ලේකම්වරුන් විසින් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ උපදෙස් අනුව හැකි ඉක්මණින් මෙම ගිණුම් සක්‍රීය කිරීම සඳහා කටයුතු කළ යුතුය.

| **පළාත් සභා** | **මහජන බැංකුව යූනියන් පෙදෙස ශාඛාව** | **ලංකා බැංකු තැප්‍රොබේන් ශාඛාව** |
|---|---|---|
| බස්නාහිර පළාත | 014100120003263 | 71353199 |
| මධ්‍යම පළාත | 014100100003264 | 71353418 |
| දකුණු පළාත | 014100170003265 | 71353540 |
| වයඹ පළාත | 014100150003266 | 71353692 |
| සබරගමුව පළාත | 014100130003267 | 71353763 |
| උතුරු මැද පළාත | 014100110003268 | 71353846 |
| ඌව පළාත | 014100190003269 | 71353914 |
| නැගෙනහිර පළාත | 014100170003270 | 71354008 |
| උතුරු පළාත | 014100150003271 | 71354064 |

3. වාහන ලියාපදිංචි කිරීමේ ගාස්තු සම්බන්ධයෙන් දැනට පවතින ක්‍රියාදාමය වෙනස් නොවනු ඇත. පළාත් සභාවලට ආදායම් මාරු කිරීමේ අදාළ අනුපාතය 2011.01.01 දින සිට 70% වනු ඇත.

4. ප්‍රධාන ලේකම්වරුන් විසින් මෙම ගිණුම්වල බැරට මාරු කරන ලද ආදායම් දේ.ආ.කො.ජ./රේ.අ.ජ. විසින් ආදායම් මරු කිරිම සඳහා පවත්වාගෙන යනු ලබන වාර්තා සමග සංසන්දනය කළ යුතු අතර මාසිකව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අධ්‍යක්ෂ ජනරාල් සහ රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල් වෙත පිටපත් සහිත ව මුදල් කොමිසම වෙත වර්ගීකරණය කරන ලද ආදායම් ප්‍රකාශයක් යැවිය යුතුය.

මෙම චක්‍රලේඛය මුදල් කොමිසමේ එකඟතාවය සහිතව නිකුත් කරන ලදී.

**පී.බී. ජයසුන්දර**
**භාණ්ඩාගාර ලේකම්**

පිටපත් : 1. විගණකාධිපති
2. ලේකම්, පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය
3. සභාපති, මුදල් කොමිසම
4. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව
5 අධ්‍යක්ෂ ජනරාල් , රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
6. අධ්‍යක්ෂ ජනරාල් , භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
7. අධ්‍යක්ෂ ජනරාල් , රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
8. සාමාන්‍යාධිකාරි, ලංකා බැංකුව
9. සාමාන්‍යාධිකාරි, මහජන බැංකුව